# නිවැරදිව හා ප්‍රවේසම් සහගතව ප්‍රතිජීවක භාවිත කිරීම සදහා ඔබ අපට අවශ්‍යයි.

ඖෂධ නිෂ්පාදකයින්

ප්‍රතිජීවක යනු සතුන්ගේ සහ මිනිසුන්ගේ රෝග, ආසාදන තත්ව පාලනය කිරීමට හා ප්‍රතිකාර කිරීමට අත්‍යාවශ්‍ය ඖෂධ වේ.

නමුත් ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව ඉතා ශීඝ්‍රයෙන් පහළ වැටෙමින් පවතී.

- මෙම වටිනා ඖෂධ නිවැරදි ආකාරයෙන් භාවිත නොකිරීම නිසා, රෝග කාරකයින් ඊට එරෙහිව ප්‍රතිරෝධය ගොඩ නඟා ගැනීම ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. බැක්ටීරියා, ප්‍රතිජීවකවලට ප්‍රතිරෝධී වූ විට, ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව හීන වන අතර ඒවා තවදුරටත් රෝගවලට එරෙහිව ක්‍රියා කළ නොහැකි තත්වයකට පත් වේ. ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවය ලෙස හදුන්වන්නේ මෙම සංසිද්ධිය යි.

- මිනිස්, සත්ව සහ ශාක අංශ තුනෙහි ම රෝගකාරකයින්ට එරෙහිව ප්‍රතිජීවක තෝරා ගැනීමේ දී, ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවය මැඩ පැවැත්වීමට හෝ අඩු කිරීම සදහා එම අංශවල කටයුතු කරන්නන් හට සාමූහික වගකීමක් ඇත. දැනට පවතින ප්‍රතිජීවක වර්ගවල පැවැත්ම හා ක්‍රියාකාරී කාර්යක්ෂමතාව අඛණ්ඩව පවත්වා ගැනීමත් නව ප්‍රතිජීවක නිපදවීමත් සතුන්ගේ සෞඛ්‍ය හා සුබසාධනය  පවත්වා ගැනීම සදහා අත්‍යාවශ්‍ය වේ.

- ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ අන්තර් රාජ්‍ය ප්‍රමිතීන්ට අනුව, මෙම අනර්ඝ ඖෂධ වගකීමෙන් හා නිවැරදි ලෙස භාවිත කිරීමෙන් ඒවායේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව අඛණ්ඩව පවත්වාගත හැක.

“ අප සියලු දෙනාට ම කළ යුතු කාර්යයක් ඇත. **විශේෂයෙන් ඖෂධ කර්මාන්තයේ නියැලෙන්නන් ලෙස** ඔබට මේ සදහා දායක විය හැක. ”

**ඔබ අපට අවශ්‍යයි!**



- ප්‍රතිජීවකවල පැවැත්ම හා ක්‍රියාකාරී කාර්යක්ෂමතාව රැක ගැනිම සදහා ඒවායේ නිවැරදි සහ වගකීම් සහගත භාවිතය තහවුරු කිරීමට එක්ව කටයුතු කළ යුතු ය.

- රෝග කාරකවල ප්‍රතිජීවකවලට එරෙහිව ඇති වන ප්‍රතිරෝධය මැඩලීම ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමුඛ අරමුණක් වී ඇත. ඖෂධ කර්මාන්තය ඇතුළු සියලුම සත්ව සෞඛ්‍ය පිළිබද කටයුතු කරන අංශ, ලෝක සත්ව සෞඛ්‍ය සංවිධානයේ අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුව ප්‍රතිජීවක, වගකීමෙන් හා නිවැරදිව, මිනිසුන්ගේ හා සතුන්ගේ සෞඛ්‍ය හා සුබසාධනය ඉහළ නැංවීම උදෙසා භාවිත කරනු දැකීම එම සංවිධානයේ අපේක්ෂාව වේ.

වැඩිදුර තොරතුරු සඳහා : www.oie-antimicrobial.com

# ඖෂධ නිෂ්පාදකයිනි

## ප්‍රතිජීවක රැකගැනීමේ දොරටු පාලක ඔබයි

ඖෂධ නිෂ්පාදකයින්

- ඖෂධ කර්මාන්තයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ ආරක්ෂිත, නිසි ක්‍රියාකාරී කාර්යක්ෂමතාවක් සහිත ප්‍රතිජීවක සංවර්ධනය හා නිෂ්පාදනය කිරීම යි. තත්වයෙන් උසස් ඖෂධ නිෂ්පාදනය මගින්, ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවයට එරෙහිව සටන් කිරීමට, ප්‍රතිජීවක නිවැරදි පුද්ගලයන්ගේ අතට පත් කිරීමට හා ඒවා නිවැරදිව සහ වගකීම් සහගතව භාවිත කිරීමට කටයුතු කිරීමට ද ඖෂධ නිෂ්පාදයකින් සහයෝගය දිය යුතු වේ.
- ඔබගේ නායකත්වය සහ මැදිහත්වීම මෙම අරගලය සදහා ඉතා වැදගත් වන අතර, ඔබගේ වෘත්තිය විශේෂඥභාවය හා කැපවීම මෙම ක්ෂේත්‍රයට අත්‍යාවශ්‍ය වේ.

## ඖෂධ නිෂ්පාදකයින්ගේ කාර්යභාරය

1. යහපත් නිෂ්පාදන ක්‍රියාවලීන් (GMP) අනුගමනය කරමින් ප්‍රතිජීවකවල ආරක්ෂිත බව, ක්‍රියාකාරී කාර්යක්ෂමතාව හා තත්වය සහතික කිරීමට කටයුතු කරන්න.
2. අලෙවි කිරීම සදහා වෙළද දැන්වීම් පළ කිරීමේ දී, නිසි අවසරයක් සහිතව අදාළ ආචාරධර්මවලට අනුව කටයුතු කරන්න. ප්‍රතිජීවක අඩංගු පශු ඖෂධ සත්ව ආහාර නිෂ්පාදකයින් වෙත කෙලින් ම අලෙවි කිරීම සදහා වෙළද දැන්වීම් පළකිරීමෙන් වලකින්න.
3. ප්‍රතිජීවක අඩංගු පශු ඖෂධ අලෙවි කිරීම සහ අපනයනය කිරීම සදහා අවසරලත් ක්‍රමවේද පමණක් අනුගමනය කරන්න.
4. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු ඖෂධ පාලන අධිකාරිය සමග සහයෝගයෙන් කටයුතු කරමින්, ප්‍රතිජීවක අලෙවිය පිළිබද සවිස්තරාත්මක දත්ත, ඒවායේ භාවිතය හා ප්‍රතිරෝධීතාවය පිළිබද ආවේක්ෂණ කටයුතු සදහා එම ආයතනයට ලබාදීමට කටයුතු කරන්න.
5. ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවය හා ඒවා නිවැරදි ලෙස භාවිත කිරීමේ අවශ්‍යතාවය හා වැදගත්කම සම්බන්ධයෙන් මෙම ඖෂධ අලෙවි කරන සෑම අවස්ථාවක දී ම අදාළ පුද්ගලයින් දැනුවත් කිරීමට කටයුතු කරන්න.
6. නිවැරදිව සහ වගකීමෙන් යුක්තව ප්‍රතිජීවක භාවිත කිරීම පිළිබද පුහුණු වැඩසටහන්වලට සහභාගී වන්න.
7. ප්‍රතිජීවක ප්‍රතිරෝධීතාවයට එරෙහිව සටන් කිරීම සදහා දායක කරගත හැකි විකල්ප වන, එන්නත් හා කඩිනමින් රෝග විනිශ්චය කළ හැකි පරීක්ෂණ ක්‍රම, වැඩිදියුණු කිරීම පිළිබද පර්යේෂණ කටයුතු සදහා දායකත්වය ලබාදීමට කටයුතු කරන්න.

